		ලිපි ද්‍රව්‍ය	20	20	15	75
		යන්ත්‍ර හා උපකරණ	72	72	72	100
		ගොඩනැගිලි හා ඉදිකිරීම්	14	14	9	64
		තැපැල් හා සන්නිවේදන	100	100	98	98
		විදුලිය හා ජලය	75	75	72	96
		ආරක්ෂක සේවා	930	930	908	98
		රියදුරු බලපත්‍ර පරීක්ෂණ ගාස්තු	133	133	122	92

		වෙනත් ගිවිසුම් ගත සේවා	362	362	362	100
36	තැපැල් දෙපාර්තමේන්තුව	රඹුක්කන තැපැල් කාර්යාලයේ ඉදිරිපස ආරක්ෂිත වැටක් ඉදිකිරීමට	877	877	877	100
37	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	ලිපි ද්‍රව්‍ය	14	14	14	100
38	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	ගමන් වියදම්	437	437	433	100
		ලිපි ද්‍රව්‍ය	22	22	22	100
		2021 අතැති බිල් පත්	40	40	40	100
		සංවර්ධන ව්‍යාපෘති	336	336	335	100
		සංවර්ධන ව්‍යාපෘති	95	95	94	99
39	මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව	ගමන් වියදම්	831	831	802	97
		ලිපි ද්‍රව්‍ය	29	29	29	100
		තැපැල් හා සන්නිවේදන	10	10	7	70
		රැකියා පොල වැඩසටහන් හා වෘත්තීය පොල වැඩසටහන	99	99	99	100
		වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සඳහා	113	113	110	97
		පුවත් පත් මිලදී ගැනීම	17	17	13	76
		2021 අතැති බිල්පත්	132	132	132	100

		වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සඳහා	169	169	0	0
40	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව	වැටුප්	13,162	13,162	13,144	100
		අතිකාල හා නිවාඩු දින දීමනා	1	1	1	100
		දීමනා	411,388	411,388	394,863	96
		ගමන් වියදම්	380	380	297	78
		ලිපි ද්‍රව්‍ය	675	675	675	100
		පරිගණක උපාංග අලුත්වඩියා කිරීම	6	6	6	100
		තැපැල් හා සන්නිවේදන	39	39	31	80
		දේපල ණය පොලී	162	162	158	98
41	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	අතිකාල	31	31	31	100
		ගමන් වියදම්	76	76	75	99
		සිවිල්	125963	125963	125240	99
		තැපැල්	270	270	159	59
		මුද්‍රණ	405	405	374	92
		වැන්දඹු අනත්දරු	1662	1662	1662	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේකාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩසමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූලය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රතිශතය ලෙස වාර්තා කිරීම.
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	841390419.94	841390419.94	-	100%
9152	යන්ත්‍රෝපකරන	332565509.35	332565509.35	-	100%
9153	ඉඩම්	346353500.00	346353500.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGCG/KG/A/DSK/02/22/37

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 19 දින.

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
කෑගල්ල.

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන විගණන වාර්තාව

2022 වර්ෂය සඳහා සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ නිරීක්ෂණ ඇතුළත් සම්පිණ්ඩන විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

ඒ.පී.එම්.කුමානායක
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SGCG/KG/A/DSK/02/22/37 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 19 දින.

දිස්ත්‍රික් ලේකම්,
කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 18 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රිකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට ගතයුතු රු.295,463,352ක ප්‍රාග්ධන වියදම් ඇතුළත්ව තිබුණි.

(ආ) අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය අනුව වර්ෂයේ අග්‍රිම ලැබීම්වලට වඩා රු.274,753,336 ක් වැඩියෙන් එම වටිනාකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම් ශේෂ 04ක 2021 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂ හා 2022 ජනවාරි 01 දිනට එම ශේෂ අතර රු.1,674,053 ක වෙනසක් පැවැතිණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිලි 33ක් ගිණුම්ගත කර නොතිබුණි. ඉන් ගොඩනැගිලි 04 ක පිරිවැය රු.6,852,766 ක් වූ අතර, ගොඩනැගිලි 29ක පිරිවැය හෝ තක්සේරු අගය නිශ්චය කර නොතිබුණි. එමෙන්ම, ගොඩනැගිලි 11ක තක්සේරු වටිනාකම් ගිණුම්ගත කර තිබුණු වටිනාකමට වඩා රු.352,939,402ක් අඩු වී තිබුණද, එය ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නොවූ රු.270,000 ක විදුලි ජනක යන්ත්‍ර 10 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි

(ඈ) කඩා ඉවත් කළ රු.6,945,000 ක් වූ පැරණි ගොඩනැගිල්ලක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඉ) රු.2,258,000ක් වූ රජයේ නිවාස වටිනාකම් නේවාසික නොවන ගොඩනැගිලි ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඊ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති ස්ථාවර වත්කම් ශේෂ 04ක එකතුවට වඩා රු.1,000,705ක් වැඩියෙන් එම වත්කම් වටිනාකම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(උ) රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැවැති රු.2,995,042ක් පිරිවැය වූ සේවා පියස 05ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සතු රු.26,700,000 ක් වූ වාහන 03 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(එ) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය 1998 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා තිබුණ ද, රු. 62,400,000ක් වූ එම ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

1.6.3 පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

රුවන්වැල්ල හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වත්කම්වලට වූ රු.240,798ක හානිය, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම්වල දක්වා තිබුණු රු. 28,432,000ක ගොඩනැගිල්ලක් සනාථ කිරීමට සාක්ෂි නොතිබුණු අතර රු. 27,340,000ක ඉඩම් සඳහා පිඹුරුපත් හැර අයිතිය තහවුරු කිරීමට ඔප්පු ඉදිරිපත් නොවුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැදීම්වලට එළැඹීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2022 දෙසැම්බර් 31 දිනට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 08 ක් වෙත ගෙවිය යුතු රු. 140,237,861 ක් පැවතුණද, මුදල් රෙගුලාසි 214 අනුව බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කළ නයිමීරිස් නිෂ්පාදන කරන පවුල් කේන්ද්‍රීය කරගත් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 21 දෙනෙකු වෙත උපකරණ ලබා දීමේදී රේඛීය රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.562,296ක් වැයකර තිබුණි.

2.3 තැන්පතු

රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 02ක් ඉක්මවූ කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු රු.280,542 ක් නිරවුල් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වූ උප කාර්යාල 41ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා වාර්ෂික සැලැසුම් සකස් කිරීමටත්, වාර්ෂික ප්‍රගතිය ඉදිරිපත් කිරීමටත් දිස්ත්‍රික් සැලැසුම් අංශය විසින් පියවර ගෙන නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) දරිද්‍රතාව තුරන් කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී හඳුන්වා දුන් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ කැගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබුණු ග්‍රාම ශක්ති සමිති 130න් 115ක්ම 2022 දෙසැම්බර් 31 දින වනවිට අක්‍රීය වී තිබුණි. ග්‍රාමශක්ති මව් සමිති ගිණුම්වල හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ වන ගිණුම්වල 2022 දෙසැම්බර් 31 දිනට පැවැති රු.57,605,311ක් අරමුණුගත කාර්යයට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවැතිණි.

(ආ) අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 02ක් කේන්ද්‍රකර අංග සම්පූර්ණ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමට 2021 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක් සඳහා ලබාදුන් රු.204.130,000 ක ප්‍රතිපාදනයෙන් රු.69,459,048ක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රජා මූල සංවිධාන 1301ක් අතුරින් 128ක් පමණක් අරුණලු සහන ණය නිකුත් කිරීමට කටයුතු කර තිබුණු අතර සමෘද්ධි බැංකු 44කින් බැංකු 17ක් අරුණලු ණය නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමෘද්ධි වැඩසටහන යටතේ සෞභාග්‍යා නිවාස සංවර්ධන ව්‍යාපෘතිය මඟින් 2022 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කළ නිවාසවලින් 2022 දෙසැම්බර් 31 දිනට රු.2,399,000ක් වූ නිවාස 45 ක ඉදිකිරීම් නිමකර නොතිබුණි.

(ඉ) දිවයිනේ වනාන්තර වැස්ම 2030 වනවිට සියයට 32කින් වර්ධනය කිරීම වෙනුවෙන් දිවයින පුරා පැළ මිලියන 75ක් සිටුවීමේ "සෑම අයෙක් එක් පැළයක්" වැඩසටහන කැගල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

කෑගල්ල දිස්ත්‍රික්කය තුළ 2016 වර්ෂයේදී ඇති වූ නායයෑම් අවදානම් තත්ත්වය හේතුවෙන් විපතට පත් වූ පවුල් 154කට නැවත පදිංචිය සඳහා රු. 150,505,800ක් ගෙවා තිබුණි. එහෙත්, ඔවුන් අවදානම් සහිත නිවාසයේම පදිංචි වී සිටීම, ගෙවූ මුදලට සරිලන ලෙස නිවසේ වැඩ අවසන් නොකිරීම, මිලදීගත් ඉඩම හා වැඩ අවසන් කළ නිවස විකිණීම, මුදල් ලබා දී ඇතත් වැඩ ආරම්භ නොකිරීම වැනි හේතු මත නැවත පදිංචි කිරීමේ එම ව්‍යාපෘතියේ සාර්ථකභාවය ගැටළුසහගත විය. එමෙන්ම, මෙම නායයෑම් හේතුවෙන් එම පවුල් නැවත පදිංචි කිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.393,161,033 ක් 2022 දෙසැම්බර් 31 දක්වාම ගෙවා නොතිබුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කුකුල් පාලන ගම්මාන ඇතිකිරීම වෙනුවෙන් කිකිළි පැටවුන් 1476ක්, ප්ලාස්ටික් ජල බඳුන් හා ආහාර බඳුන් 148ක් හා පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම වෙනුවෙන් රු.808,432ක් වැයකර තිබුණි. එහෙත්, එම අරමුදල් මගින් ව්‍යාපෘති අරමුණුවලට කිසිදු සබඳතාවක් නොමැති මාර්ග 06 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.2,941,108 ක් වැයකර තිබුණු අතර එය අරමුණුගත අවශ්‍යතා වෙනුවෙන් කළ වියදමින් සියයට 264 ක ප්‍රතිශතයක් විය.

(ආ) එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙකු බිහිකිරීමේ වැඩසටහන යටතේ එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයකට අවම වශයෙන් එක් ව්‍යවසායකයෙකු බැගින් නව ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින් බිහිකිරීම අරමුණු විය. එහෙත්, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වූ ග්‍රාම නිලධාරී වසම් 38 න් වසම් 20කම, කිසිදු ව්‍යවසායකයෙකු මෙම ව්‍යාපෘතිය සඳහා සහභාගිකර වීමට කටයුතු කර නොතිබුණි. ඉතිරි වසම් 18න් ප්‍රතිලාභීන් 19 දෙනෙකු වෙත රු.1,207,187 ක් වැයකර ග්‍රාම නිලධාරී වසම් 38ම නියෝජනය වන පරිදි උපකරණ 38 ක් මිල දී ගෙන බෙදාහැර තිබුණි.

(ඇ) එක් ග්‍රාම නිලධාරී වසමකම එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ වැඩස්ටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11කට වෙන්කළ රු.26,099,607 කින් රු.3,135,547ක් ඉතිරි වී තිබුණි. එමෙන්ම, මිල උද්ධමනය හේතුවෙන් ප්‍රතිලාභීන් 37 දෙනෙකු විසින් ගෙවන ලද ඔවුන්ගේ දායකය ආපසු ගෙවීමට කටයුතු කර තිබුණු අතර ප්‍රතිලාභීන් 28 දෙනෙකු විසින් විවිධ හේතු මත එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

වර්ෂය අවසානයේ ප්‍රතිපාදන ලැබීම, අග්‍රිම නොලැබීම, ව්‍යාපෘති ඉටුකිරීමට කාලය ප්‍රමාණවත් නොවීම, ද්‍රව්‍ය හිඟය, ද්‍රව්‍ය මිල ඉහළ යාම, කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම යනාදී කරුණු හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 යටතේ ඉටු කිරීමට නියමිතව තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 589 ක් වූ ව්‍යාපෘති 4204ක් ඉටුකළ නොහැකි වී තිබුණු අතර, රු. මිලියන 30ක් වූ ව්‍යාපෘති 65ක් අර්ධ වශයෙන් ඉටුකර තිබුණි.

3.1.6 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා දෙහිඕවිට දැරණියගල මාර්ගයට අදාළ ඉඩම් කැබලි 52 ක් සඳහා 2014 වර්ෂයේ සිට මේ දක්වාම ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 9 වන වගන්තිය යටතේ වන්දි පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණු අතර,පරීක්ෂණ පැවැත්වූ ඉඩම් කැබලි 112 ක් තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) කැබලි 32කට රු.15,658,038ක වන්දි මුදල් ලබා ගැනීමට 2022 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දින දක්වාම එම මුදල් ලැබී නොතිබුණි.

(ඇ) ඉඩම් වෙනුවෙන් ගෙවූ රු.65,109,388.95ක වන්දි මුදලට අදාළ පොලී මුදල් ලබා ගැනීමට 2021 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා තිබුණද, 2023 ජනවාරි මාසය වන තුරුත් එම මුදල් ලැබී නොතිබුණි.

(ඇ) වන්දි හා පොලී ගෙවා අවසන් කර ඇති ඉඩම් කැබලි 30 ක් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 (1) වගන්තිය අනුව ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.

3.1.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මී මැසි පාලනය ආශ්‍රිතව තාක්ෂණික දැනුම හා උපකරණ ලබා දී මී පැණි නිෂ්පාදනය ප්‍රවලිත කිරීම සඳහා රු.1,264,994 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එහෙත්, රු.393,050කට මිල දී ගත් උපකරණ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම හැර මී පැණි නිෂ්පාදනය ප්‍රවලිත කිරීමට සිදුකළ වෙනත් කාර්යයක් නොවුණි. එමෙන්ම, මී මැසි පෙට්ටි 67ක් ඇතුළු විවිධ උපකරණ 84ක් මිල දී ගත් දින සිට අභාවිතව පැවැතිණි.

(ආ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වූ පොල්ගස්වත්ත ක්‍රීඩා පිටියක් සංවර්ධනය කිරීම 2021 ජූලි මාසයේ නිමකර තිබුණි. එහෙත්, 2022 ඔක්තෝබර් වන විටත් එම ක්‍රීඩා පිටිය අභාවිතව වල් බිහි වී අත්හැර දමා තිබුණු බැවින් එය සංවර්ධනය සඳහා වැය කළ රු. 1,470,100ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඇ) අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කුළුබඩු නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 43 දෙනෙකු වෙත උපකරණ ලබා දී තිබුණද, ඉන් 34 දෙනෙකු සිය නිෂ්පාදන කටයුතු අත් හැරීම නිසා ඔවුන් වෙත ලබා දුන් රු. 3,991,600 ක උපකරණ පිරිවැය නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඈ) බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩා පිටියක් සංවර්ධනයට රු.990,000 ක් වැයකර තිබුණ ද, කඩා ඉවත්කළ කළු ගල් කියුබ 80ක් 2022 දෙසැම්බර් මාසය දක්වාම වසරක පමණ කාලයක් එම ක්‍රීඩා පිටිය මැද ගොඩගසා තිබීම හේතුවෙන් එය භාවිතා කළ නොහැකිව තිබුණි.

(ඉ) හරිත ව්‍යවසායකයන් ප්‍රවර්ධනය මගින් පරිසරය සංරක්ෂණ කිරීමේ වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් 19 දෙනෙකුගෙන් 03 දෙනෙකු එම ව්‍යාපෘතියෙන් ඉවත් වී තිබුණු අතර පළමු වාරිකය වූ රු.150,000 ක් එක් ව්‍යවසායකයෙකු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර මහන මැෂින් 43ක් මිල දී ගැනීම නිසා රු. 422,970ක පාඩුවක් සිදු වී තිබුණු අතර අවම මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොතිබුණි.

(ආ) කුකුළු පාලන ගම්මාන ඇති කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යවාසයකයින් 100 දෙනෙකු වෙත රු.4,747,300ක් වූ උපකරණ හා කුකුළු පැටවුන් 5848 ක් බෙදාහැර තිබුණි. පසුව, කිසියම් රෝගී තත්වයක් මත කුකුල් පැටවුන් 4458 ක් එනම්, මිල දී ගත් සංඛ්‍යාවෙන් සියයට 76 ක ප්‍රතිශතයක් මරණයට පත් වී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිල ගණන් ඇගයීම හැර, කිසිදු ආකාරයක තාක්ෂණික ඇගයීමක් සිදු නොකර මෙම මිල දී ගැනීම සිදු කිරීම ඊට හේතුව වී තිබුණි.

(ඇ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි පවුල් 156ක් වෙත තේ පැල 222,671ක් රු.6,169,198 කට බෙදා හැර තිබුණ ද, මේ දක්වාම සැපයුම්කරුට මුදල් ගෙවා නොතිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී ලංසු කැඳවීම, ලංසු ලබා ගැනීම හා ලංසු භාර ගැනීම අවසන් කිරීම පිළිබඳ නිශ්චිත දින නියම කර නොතිබුණි. මේ සඳහා පත්කළ තාක්ෂණික ඇගැයීම් කමිටුවට තේ වගාව හා සම්බන්ධ ප්‍රවීනතාව සහිත නිලධාරියෙකු වෙනුවට කෘෂිකර්ම උපදේශකවරයෙකු පත්කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු. 1,938,425ක් වූ අර්ධ වශයෙන් නිම කළ සේවා පියස මධ්‍යස්ථාන 06ක් 2022 දෙසැම්බර් දක්වාම සම්පූර්ණ කර නොනිබුණි.

(ආ) සේවා පියස මධ්‍යස්ථාන හා විවිධ කර්මාන්ත වෙනුවෙන් වූ බහුකාර්ය ගොඩනැගිලිවල ඉදි කිරීම් ප්‍රතිපාදන නොලැබීම මත අතරමග අත්හැර දමා තිබුණි. මේ නිසා එම ඉදි කිරීම් නිම කරන තෙක් වැයකළ රු.8,569,900ක් ආනාර්ථික වියදම් බවට පත් වී තිබුණි.

(ඇ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෘෂි භෝග වියලන මධ්‍යස්ථානයක් ඉදිකිරීම් හා ඊට අවශ්‍ය උපකරණ වෙනුවෙන් රු.2,723,538 ක් වැයකර තිබුණ ද, එම ඉදි කිරීම් භූමියේ හිමිකාරත්වය ලබා ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ඈ) වර්ග අඩි 3000ක් සහිත රු.301,664ක් පිරිවැය වූ මේ වන විට අබලන්ව පවතින රඹුක්කන ප්‍රාදේශීය ලේකම් නිල නිවස 2017 වර්ෂයේ සිට අභාවිතව පවතී.

(ඉ) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දේවාලේගම වසමේ පිහිටි ඉඩමක් රජයට පවරා නොගෙන රු.108,315ක් වැයකර සේවා පියසක් ඉදිකර තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) 2004 මැයි 11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරි, ප්‍රධාන ලිපිකරු හා වැටුප් ලිපිකරු විසින් මාස 03කට වරක් වෙනස් කරමින් මුර පද 03ක් වෙන් වෙන්ව භාවිතා කළ යුතු විය. එහෙත්, බුලත්කොහුපිටිය, වරකාපොල, දෙහිඕවිට, දැරණියගල, යටියන්තොට ,ගලිගමුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එක් මුර පදයක් පමණක් වසර ගණනාවක තිස්සේ අඛණ්ඩව භාවිතා කර තිබුණි.

(ආ) අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කිසිදු සැලැසුමක් නොමැතිව කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් මිල දී ගැනීම් පමණක් අරමුණු කරගෙන මිල දී ගෙන තිබුණු ඇඟලුම් කර්මාන්තය සඳහා අදාළ වන යන්ත්‍රෝපකරණ 22ක් 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04ක පමණ කාලයක් අභාවිතව වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තිබුණි.

4 යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් මිනිස් දින 1708 යොදවා විගණන කාර්යයන් 78 ඉටු කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ විගණන කාර්යයන් 43 ක් පමණක් කාර්යාල මට්ටමින් ඉටුකර තිබුණි. ප්‍රමාණවත් කාලයක් ගත වී තිබුණද, ඉටු කළ එම කාර්යයන් වෙනුවෙන් නිකුත් කළ වාර්තා 43න් වාර්තා 34ක් සඳහා අදාළ වගකිවයුතු ආයතන විසින් පිළිතුරු ලබා දී නොතිබුණි.

(ආ) 2022 වර්ෂය තුළ රු. 243,543,984 ක ආදායමක් රැස්කර තිබුණද, 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වැනි මාර්ගෝපදේශය පරිදි ආදායම් විගණනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වැඩසටහන් සකස්කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 11ක් සඳහා බහුකාර්ය අභ්‍යාසලාභීන් 1910දෙනෙකු බඳවාගෙන තිබුණද, ඉන් 452 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දිනට ඉවත් වී තිබුණි. 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඔවුන් වෙත රු.1,130,448,384 ක දීමනා ගෙවා තිබුණද, හය මාසික පුහුණුවෙන් පසු PL-01 ශ්‍රේණියේ ස්ථිරකර පත්වීම් ලබා දී නොතිබුණු අතර, රජයේ ගොවිපොළවල සහ අත්හැර දැමූ ඉඩම්වල කෘෂි තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඵළවළු සහ පළතුරු නිෂ්පාදන කටයුතුවලට යෙදවීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ට අදාලව අනුමත තනතුරු සම්බන්ධ 1234 කින් පුරප්පාඩු සංඛ්‍යාව 127 ක් පැවැති අතර සංවර්ධන නිලධාරී තනතුරෙහි අතිරික්ත සේවක සංඛ්‍යාව 1253 ක් විය.

ටී.පී.එම්.කුමානායක
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම		
		100%-90%	75%-89%	50%-74%
1	ඉඩම් දීමනාපත්‍ර නිකුත් කිරීම.	127%		
2	ගම සමඟ පිළිසඳර 2022 වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.			25%
3	සෞභාග්‍යා නිවාස සංවර්ධන වැඩසටහන යටතේ රු. ලක්ෂ 2 නිවාස ඉදිකිරීම.	127%		
4	සෞභාග්‍යා ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ තෝරාගත් ගෙවතු සඳහා එළවළු පැළ බදුන් සැපයීම.	99%		
5	වයස අවු. 10 – 35 අතර ආබාධිත පුද්ගලයින් වෘත්තීය පුහුණුවට යොමු කිරීම.	136%		

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
1	1.1	1.1.1- දිළිඳු පවුල් ප්‍රතිශතය	8.7		
	1.4	1.4.2-උප්පැන්න, විවාහ,ඉඩම් හිමිකම් වැනි කරුණු සම්බන්ධව හිමිකම් නොමැති පවුල් සංඛ්‍යාව	–		
2	2.2	2.2.1 - වයස් අවුරුදු 5ට අඩු මිටි දරුවන් 2.2.2 - වයස අවුරුදු 5ට අඩු කෘෂ/ අඩු බර දරුවන් ප්‍රතිශතය	62.8		
	2.4	2.4.1 - පුරන් කුඹුරු ප්‍රමාණය	අක්කර 263.0815		
3	3.1	3.1 මාතෘ මරණ අනුපාතය	සංඛ්‍යාව-11		
	3.2	3.2.2 - බිළිඳු මරණ	1.85		
	3.3	3.3.2,3.3.3 ක්ෂය, මැලේරියා රෝගීන් සංඛ්‍යාව	සංඛ්‍යාව-10		
4	4.1	4.1.1 දිස්ත්‍රික් පාසල් නොයන හා කඩින් කඩ පාසල් යන දරුවන් ප්‍රතිශතය	0.17		
5	5.2	5.2.1 කාන්තාවන්ට හා ළමයින්ට සිදුවන සියලුම ආකාරයේ හිංසන ප්‍රමාණය (පැමිණිළි සංඛ්‍යාව)	ළමා හිංසන සංඛ්‍යාව -524 කාන්තා හිංසන සංඛ්‍යාව-297		
6	6.1	6.1.1 සුරක්ෂිත ජලය පරිහරණය කරන පවුල් ප්‍රතිශතය			88.8
		6.2.1 සනීපාරක්ෂක පහසුකම් සහිත පවුල් ප්‍රතිශතය			95.61
7	7.1	7.1.1 විදුලිය නොමැති පවුල් ප්‍රතිශතය	0.73		
8	8.5	8.5.1 විරැකියා අනුපාතය	41.36		

9	9.1	9.1.1 සංවර්ධනය කරන ලද මුලු මාර්ග ප්‍රමාණය (කි.මී. වලින්)	කි.මී 8293.9		
11	11.1	11.1.1 ස්ථිර නිවාස නොමැති පවුල් ප්‍රතිශතය	1.13		
12	12.5	12.5.1 දිස්ත්‍රික්කය තුල ජනනය වන නොදිරූ සන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම	දෛනිකව නොදිරන අපද්‍රව්‍ය ටොන් 35 එකතු වන අතර ඉන් ප්‍රතිචක්‍රීකරණය සඳහා ටොන් 7.5 ක් ද,බේල් කිරීම සඳහා ටොන් 27.5 ද යොදා ගනු ලබයි.		
13	13.1	13.1.1 ආපදා හේතුවෙන් මිය යන සංඛ්‍යාව	6		
14	14.1	14.1.1 දිස්ත්‍රික්කයේ ඇති ජල මූලාශ්‍ර සංරක්ෂණය කර ඇති ප්‍රමාණය	190		
15	15.1	15.1.1 වන ආවරණයේ ප්‍රතිශතය	23.9		
	15.8	15.8.1 ආක්‍රමණශීලී ශාක හා සතුන් ප්‍රතිශතය	–		
16	16.1	16.1.1 හා 16.1.3 කායික හා මානසික හිංසනයට නතු ප්‍රතිශතය (පැමිණිලි සංඛ්‍යාව අනුව)	කායික හිංසන සංඛ්‍යාව -420 මානසික හිංසන කායික හිංසන සංඛ්‍යාව -420 මානසික හිංසන සංඛ්‍යාව-185		

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්තය)
ජ්‍යෙෂ්ඨ	15	14	1
තෘතියික	4	3	1
ද්විතියික	93	197	-104
ප්‍රාථමික	27	23	4

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන් ලැබ ඇති ආකාරය

ද්විතීක කාණ්ඩයේ නිලධාරීන්

*තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර අනුමත තනතුරු දෙක පුරප්පාඩුවී පවතින බැවින් එම කටයුතු හා එක් තාක්ෂණ සහායක නිලධාරියෙකුගේ පුරප්පාඩුවක් පවතින බැවින් එම විෂය සමගාමී කටයුතු සිදුකිරීමේ දී සැලකිය යුතු ප්‍රමාදයක් සමහර අවස්ථාවන්හිදී ඇතිවන බව නිරීක්ෂණය වේ.

*සංවර්ධන නිලධාරී අනුමත තනතුරු සංඛ්‍යාව 45 වුවද නිලධාරීන් 155ක් සිටින බැවින් 110ක අතිරික්තයක් පවතියි. ආයතනයේ පවතින සම්පත් භාවිතයේදී ගැටළු මතුවන අතරම මානව සම්පත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස යොදවා ගැනීමේ ගැටළු පැන නැගී ඇත. එසේම අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා මෙතෙක් කාර්ය මණ්ඩල අනුමැතියක් ලැබී නොතිබීම මත ස්ථාන මාරුවීම් ආදියෙහිදී ගැටළු මතුවී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය(දේශීය/විදේශීය)	නිමවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	වාර්ෂික අයවැය පිළියෙල කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	40	දින 01	✓		දේශීය	වාර්ෂික අයවැය පිළියෙල කිරීම සම්බන්ධ මූලික පුහුණුව
2	ප්‍රසම්පාදන පුහුණුව	75	දින 02	✓		දේශීය	ප්‍රසම්පාදනය පිළිබඳ මූලික දැනුම
3	ආකල්ප සංවර්ධන පුහුණුව	120	දින 01	✓		දේශීය	දෛනික ජීවිතයේදී (රාජකාරී හා පෞද්ගලික) ධනාත්මක ආකල්ප සංවර්ධනය හා එහි ප්‍රායෝගික භාවිතය
4	කාර්යාල ක්‍රම පුහුණුව	120	දින 01	✓		දේශීය	රාජකාරිමය කටයුතු සඳහා අවශ්‍යය වන කාර්යාල ක්‍රම සම්බන්ධව මූලික දැනුම
5	ආකල්ප සංවර්ධන වැඩසටහන (ප්‍රා.ලේ සඳහා)	120	දින 01	✓		දේශීය	දෛනික ජීවිතයේදී (රාජකාරී හා පෞද්ගලික) ධනාත්මක ආකල්ප සංවර්ධනය හා එහි ප්‍රායෝගික භාවිතය
6	තැපෑල කලමනාකරණය	20	දින 01	✓		දේශීය	ආයතනයක් තුළ තැපෑල කලමනාකරණය සිදු කරන ආකාරය හා ඒ හා සම්බන්ධ මූලික දැනුම
7	විගණන පුහුණුව	50	දින 02	✓		දේශීය	විගණනය සම්බන්ධ මූලික දැනුම
8	ධාරිතා සංවර්ධන පුහුණුව	100	දින 01	✓		දේශීය	නායකත්වය, පෞර්ෂත්ව සංවර්ධනය, විනය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුව
9	මහජන සම්බන්ධතා/සේවාලාභී සත්කාරය හා විනය	55	දින 01	✓		දේශීය	මහජන සම්බන්ධතාවය හා විනය පවත්වාගන්නා ආකාරය සම්බන්ධව සාමාන්‍ය දැනුම ලබාදීම

10	මූලික විමර්ශන පුහුණුව	45	දින 02	✓		දේශීය	මූලික විමර්ශන සම්බන්ධ මූලික දැනුම සහ ඒ හා සම්බන්ධ ගැටළු පිළිබඳ අධ්‍යයනය
11	තොරතුරු තාක්ෂණය හා පරිගණක භාවිතය	30	දින 01	✓		දේශීය	එදිනෙදා රාජකාරිමය කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන තොරතුරු තාක්ෂණය සම්බන්ධ ප්‍රායෝගික දැනුම ලබාදීම.
12	Internet Money	250	දින 01	✓		දේශීය	අන්තර්ජාලය ඔස්සේ මුදල් ඉපයීම සම්බන්ධ මූලික දැනුම
13	විශ්‍රාම වැටුප් පුහුණුව	60	දින 01	✓		දේශීය	විශ්‍රාම වැටුප් සම්බන්ධ මූලික දැනුම
14	රසවින්දනය තුළින් මානව ශක්ති සංවර්ධනය (ප්‍රා.ලේ.)	150	දින 01	✓		දේශීය	රසවින්දනය තුළින් පෞර්ෂ සංවර්ධනය ප්‍රායෝගිකව දැනුම ලබාදීම.
15	මාධ්‍යකරණ පුහුණුව	30	දින 01	✓		දේශීය	කැමරාකරණය, සංස්කරණය සම්බන්ධ මූලික දැනුම ප්‍රායෝගික ලබාදීම
16	රසවින්දනය තුළින් මානව ශක්ති සංවර්ධනය දි.ලේ.	110	දින 01	✓		දේශීය	රසවින්දනය තුළින් පෞර්ෂ සංවර්ධනය ප්‍රායෝගිකව දැනුම ලබාදීම.
17	කා.කා.ස.පරිගණක පුහුණුව	20	දින 01	✓		දේශීය	එදිනෙදා රාජකාරිමය කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන තොරතුරු තාක්ෂණය සම්බන්ධ ප්‍රායෝගික දැනුම ලබාදීම.
18	ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන	35	දින 02	✓		දේශීය	සාමූහික ක්‍රියාකාරකම් ඔස්සේ නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම
19	ගිණුම් ක්‍රම පුහුණුව (සං.නි. කාර්යක්ෂමතා කඩයිම් විභාගය වෙනුවෙන්)	100	දින 01	✓		දේශීය	පැවති කාර්යක්ෂමතා කඩයිම් විභාග ප්‍රශ්නෝත්තර සාකච්ඡා කිරීම හා ගිණුම් ක්‍රම විෂයට අදාළව විෂය කරුණු සාකච්ඡා කිරීම.

20	ගිණුම් ක්‍රම පුහුණුව (සං.නි. කාර්යක්ෂමතා කඩඉම් විභාගය වෙනුවෙන්) 2 කොටස	80	දින 01	✓		දේශීය	පැවති කාර්යක්ෂමතා කඩයිම් විභාග ප්‍රශ්නෝත්තර සාකච්ඡා කිරීම හා ගිණුම් ක්‍රම විෂයට අදාළව විෂය කරුණු සාකච්ඡා කිරීම.
21	තොරතුරු තාක්ෂණය තුළින් ඵලදායිතාව ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන	20	දින 01	✓		දේශීය	තොරතුරු තාක්ෂණය තුළින් ඵලදායිතාව ඉහල නැංවීම සම්බන්ධව ප්‍රායෝගික අත්දැකීම් සහිතව දැනුම ලබාදීම
22	MS Access පුහුණුව	24	දින 01	✓		දේශීය	MS Access හා සම්බන්ධ මූලික දැනුම ප්‍රායෝගිකව ලබාදීම

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම **(මු.රෙ.445)**	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල , ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේකය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂිකමුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල නොවේ	ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ වෙනත් කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමට සිදුවීම නිසා නියමිත දිනට පිළිතුරු ලබාදීමට අපහසු වූ අවස්ථා පවතී.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ වෙනත් කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමට සිදුවීම නිසා නියමිත දිනට පිළිතුරු ලබාදීමට අපහසු වූ අවස්ථා පවතී.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම.	අනුකූල වේ		

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේකයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 216/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය	අනුකූල නොවේ	ඉන්ධන හිඟය පැවතීම හා ගමන් සීමා කිරීම නිසා	

	වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුකුව තිබූ හේස සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.46000 ක ශේෂයක් පමණක් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල නොවේ	අඩුපාඩු සකස් නොකරන ලද ව්‍යාපෘතියක රැඳවුමක් පවතින අතර එය නොපමාව නිරවුල් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.	

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	දිස්ත්‍රික් ලේකම් ආදායම් ගණන් දීමේ නිළධාරියෙකු නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	රාජ්‍ය ප්‍රතිපත්ති මත වෙනස් වී ඇත.	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			

17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමටපහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්මතුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැකිවෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම	අනුකූල වේ		

19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්දන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්ෙයෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිතුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		